# පැහැර ගැනීම්

වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු ක්‍රමය ලංකාවේ කෙතරම් ජඩ ආකාරයකට ක්‍රියාත්මකවේද යන්න දැන් සිදුවෙන දෙයින් මනාව පැහැදිලි වෙයි. පාර්ලිමේන්තුව වැසිකිලි වළක් යැයි කියමින් එය පිරිසිදු කිරීමට එහි වැඩම කෙළේ යැයි දෙසූ භික්ෂූන් වහන්සේ දැන් වළේම වළඳති. මේ භික්ෂූන් වහන්සේ නිසා අනෙකුත් භික්ෂූන් වහන්සේට විඳීමට සිදුවන අපහාස හා නින්දා ගැන අපි කල්ඇතිව ම ප්‍රකාශ කෙළෙමු. සිංහල බෞද්ධයන් විසින් පොදුවේ භික්ෂූන් වහන්සේට ගරහනු ලැබෙයි නම් ඒ වහාම නැවැත්විය යුතු ය. අලජ්ජී භික්ෂූන් වහන්සේ බුදුන් වහන්සේ වැඩ සිටි කාලයේ දී ද වාසය කෙළේ නම් වර්තමානය ගැන අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ජාතික හෙළ උරුමයේ බොහෝ නායකයන්ට ජාති ප්‍රේමයකට වඩා ඇත්තේ වෙන වෙන අවශ්‍යතාවන් ය. කතළුවේ හිමියන් සමග කතානායක ලොකුබණ්ඩාර මහතා හමුවීමට වැඩම කර ඇති කොලොන්නාවේ සුමංගල හිමියෝ පාර්ලිමේන්තු භික්ෂු දේශපාලනයට මුල පිරූ භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේට ඒ අදහස ලැබුණේ කෙසේ ද යන්න තවමත් හෙළි වී නැත. හොඳ හොඳ නැටුම් එළිවෙන ජාමයට යැයි කීවා සේ තව තවත් පසුව හෙළිදරවු වනු ඇත. දෙකට දෙක කිරීමෙන් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි දතට දතක් හා ඇසට ඇසක් යන්නට තවත් දෙයක් එකතුකළ ජාතික හෙළ උරුමය අද ඒ ප්‍රතිපත්තිය ඔවුන් අර්ථ දක්වන ආකාරයට තවත් පියවරක් ඉදිරියට ගෙන ගොස් ඇත. ජාතික හෙළ උරුමයේ භික්ෂූන් වහන්සේ දෙනමක් පැහැර ගෙනගියේ යැයි කියමින් ඒ නිෂ්ක්‍රීය කිරීමට උත්සාහ කළ ජාතික හෙළ උරුමය අද ඉන් එක් නමකගේ පාර්ලිමේන්තු ධුරය ඉවත්කිරීමට කටයුතු කරමින් සිටියි. එදා කරන ලද්දේ ඊනියා නිෂ්ක්‍රියකිරීමක් නොව ලොකුබණ්ඩාර මහතාට කතානායකවීමට ඡන්දය පාවිච්චි කිරීම පමණකි. පළමු වටයේ ම දෙනමක් ආණ්ඩුව සමග ඡන්දය දෙන බව දැන දැනත් ජාතික හෙළ උරුමය එය නිෂ්ක්‍රියකිරීමට පළමු වටයේ ඉදිරිපත්  නොවූයේ ලොකුබණ්ඩාර මහතා ඡන්ද 109ක් ලබා කෙසේ වුවත් දිනන බව විශ්වාස  කළ බැවිනි. එහෙත් එක් ඡන්දයක් අවලංගුවීමත් සමග එය එසේ නොවන බව වැටහුණු ජාතික හෙළ උරුම භික්ෂූන් වහන්සේ තුන්වැනි වටයේ දී ඊනියා නිෂ්ක්‍රීය ක්‍රියාවක යෙදී ලොකුබන්ඩාර මහතා දිනවීමට කටයුතු කළහ. දැන් ජාතික හෙළ උරුමය කර ඇත්තේ ඔවුන්ට අනුව පැහැරගෙන යනු ලැබූ කතළුවේ හිමියන් නැවත පැහැරගෙන යෑමකි. මේ සම්බන්ධයෙන් කතළුවේ හිමියන් කුමක් කියන්නේ දැයි දැනගැනීමට නැත. එහෙත් ජාතික හෙළ උරුමය ක්‍රියාකරන්නේ බුදුන්වහන්සේගේ පිළිවෙත අනුව නොව බයිබලයේ පරණ තෙස්තමේන්තුව අනුව බව පැහැදිලි ය. පල්ලියේ ද වෙසක් උත්සව පවත්වන මෙකල, ක්‍රිස්තියානි පූජකවරු හිමිපාණන්වහන්සේ වන මෙකල, පල්ලියේ ඒජන්තයන් වටාපත සමග ගීත සජ්ඣායනා ඉදිරිපත්කළ මෙකළ, පාර්ලිමේන්තුවට පාරමිතා පෙරහැර පවත්වා භික්ෂූන්වහන්සේගේ ගෞරවය කෙළසීමට කටයුතුකිරීම පිළිබඳ පුදුම විය යුතු නොවේ. කලක සිට බෞද්ධ සංකේත කෙළසීමට, බෞද්ධයන් යොදාගන්නා වචන අවතක්සේරුකිරීමට, බුදුදහම තවත් ආගමක් පමණක් බවට පත්කිරීමට කටයුතු කෙරෙමින් තිබෙන බව රහසක් නො වෙයි. පංචමහාවාද සමයේ ඇරඹි ඕල්කට් බුද්ධාගම අද ධර්මදේශකයන් වහන්සේගෙන් නොව ස්ත්‍රී කටහඬින් යාතිකා කරන්නන්, චීවරධාරී ටෙලිනළුවන්, බොරු විද්‍යාඥයන් ආදීන්ගෙන් පිරෙමින් පවතියි. බ්‍රිතානීන් විසින් ඇතිකරන ලද අධ්‍යාපනය හරහා බිහි වී ඇති ඕල්කට් බුද්ධාගම වෙනුවෙන් සැමදාමත් පෙනී සිට ඇත්තේ අරක්කු රේන්දකරුවන්, බුකිකරුවන්, උගස්කරුවන් හා ඒ අධ්‍යාපනය හරහා ම බිහිවූ ඇතැම් වෘත්තීයකයන් ආදීන් ය. ධර්මපාලතුමා එකල ඇතැම් අලජ්ජී භික්ෂූන්වහන්සේ විවේචනය කරන විට ඕල්කට් බෞද්ධයෝ කිසිම භික්ෂූන් වහන්සේ නමක විවේචනය කිරීමට නොහැකිය යනුවෙන් නීතියක් පණවා එතුමාට පහර දුන්හ. අවසානයේ දී ධර්මපාලතුමාට මෙරට එපාකරවන ලද්දේ ඕල්කට් බෞද්ධයන් විසිනි. එහු ඕල්කට් බෞද්ධයෝ ම අද ධර්මපාලතුමාගේ ගුණ සමරති! අද ද ඕල්කට් බෞද්ධයන් එදා මෙන් ම නීති අතර සැඟවෙනු දක්නට ඇත. සිංහල බෞද්ධයන්ට නිදහස දිනාගත හැක්කේ බ්‍රිතානීන්ගේ අධ්‍යාපනය හරහා බිහි වී අද ඇමරිකන් ක්‍රිස්තියානි සංස්කෘතිය තම සංස්කෘතිය කරගත් ඕල්කට් බුද්ධාගම ද තත්ආකාරයෙන් අවබෝධ කරගැනීමෙන් ය.

සිංහල බෞද්ධයන් ඉතා විශාල පිරිසක් සන්ධානයට ඡන්දය දී ඇති නමුත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය කටයුතු කරන්නේ වෙනත් පිරිසකගේ නියෝජිතවරියක ලෙසින් ය. ඇයට අද සන්ධානය අමතක ය. සන්ධානය බලයට පත්කරන ලද්දේ කවුරුන් විසින් යන්න ද අමතක ය. ඇය කටයුතුකරන්නේ සන්ධානය ජයග්‍රහණය කෙළේ ඇගේ ජනප්‍රියභාවය නිසා යැයි උපකල්පනය කරමින් ය. අද ඇය ද පැහැර ගැනීමක යෙදෙයි. ඒ ජනමතය වෙයි. 1994 දී

© Prof. Nalin De Silva

පොදු පෙරමුණ බලයට පත්වුයේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වයෙන් හා විජාතික බලවේගවල ආධාරයෙන් බව පැහැදිලි ය. එහෙත් 2004 දී සන්ධානය බලයට පත්වුයේ චන්ද්‍රිකා කුමාරතුංග නායකත්වයේ සිටිය දී පවා ය, ජාතික බලවේගවල ආධාරයෙන් ය. සිංහලයන් 2004 දී සන්ධානය ඡන්දය දුන්නේ කුමාරතුංග මහත්මිය ගැන නොදැන නොවෙයි. ඇය දෝන කතිරිනාවක බව දැන දැන ම සිංහලයෝ සන්ධානයට ඡන්දය දුන්හ. ඒ අඩුම තරමින් ජනතා විමුක්ති පෙරමුණට හා සන්ධානයේ අනෙක් බලවේගවලට සාමූහික ව විමලධර්මසූරිය කෙනකු වී ඇය පාලනය කිරීමට ය. එසේ ඡන්දය දීමට ප්‍රධාන හේතුවක් වූයේ අනෙක් පසෙහි සිටි දොන් ජුවන් ධර්මපාලලා පරාජය කිරීමට තිබූ අවශ්‍යතාවය ය. පාර්ලිමේන්තු පාරමිතා පෙරහැරේ කස පුපුරවන්නේ හා විලක්කු ගෙන යන්නේ කවුරුන් දැයි දැන සිටියෝ ඒ පෙරහැරට එක් නොවූහ.

කුමාරතුංග මහත්මිය වැඩකරන්නේ ඇගේ ම වූ න්‍යාය පත්‍රයකට ය. ඇයට එහි දී යම් ප්‍රමාණයකට බටහිරයන්ගේ ආධාර ලැබෙයි. ඇයට අවශ්‍ය කෙසේ හෝ බලයේ රැඳී සිටීමට පමණ ය. අවුරුදු දහයක් විධායක ජනාධිපධිති ක්‍රමය ආරක්‍ෂා කළ ඇය දැන් ඒ ක්‍රමය වෙනස්කරන්නට උත්සාහ කරන්නේ ඇයට නැවත ජනාධිපතිනිය වීමට නොහැකි නිසා බව නොදන්නා බටහිර දේශපාලන විද්‍යාඥයකුවත් සිටිය නො හැකි ය. අවශ්‍ය වුවහොත් ඇය එ ජා පක්‍ෂය සමග වුව ද සන්ධානයකට එළඹෙනු ඇත. ඒ ඇගේ දේශපාලන ව්‍යාපෘතිය වෙනුවෙන් ය. අද කළ යුත්තේ ඇගේ දේශපාලන ව්‍යාපෘතිය පැරදවීම ය.

ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක ඡන්දදායකයාට බලය ඇත්තේ පාර්ලිමේන්තුව විසුරුවාහළ දින සිට මැතිවරණය පැවැත්වෙන දිනය දක්වා පමණකි. ඒ බව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද දනියි. එපමණක් නොව දේශපාලන පක්‍ෂවලට ද ලංකාවේ බලයක් නොමැති බව ඇය දනියි. බලය ඇත්තේ නායක නායිකාවන්ට මිස පක්‍ෂවල සෙසු සාමාජික සාමාජිකාවන්ට නො වෙයි. 1994 සිට ඇය කර ඇත්තේ තමා නායකත්වය දරණ පක්‍ෂය පමණක් නොව ශ්‍රී ල නි ප මූලිකත්වයෙන් ඇතිකරගත් සන්ධානවල අනෙක් පක්‍ෂ ද බලරහිත කිරීම ය. අද ඇය උත්සාහකරන්නේ ජ වි පෙරමුණේ ද බලය බිඳ දැමීමට ය. ඊනියා සාම සාකච්ඡා හා එයට අදාළ මණ්ඩල පිහිටුවීම සම්බන්ධයෙන් ඇය සාකච්ඡා කරන්නේ ඇයට අවශ්‍ය කිහිප දෙනකු සමග පමණ ය. ජ වි පෙ ඇගේ බහට අවනත නොවන්නේ නම් ඒ පක්‍ෂයට ආණ්ඩුවෙන් ඉවත්වීමට ඉඩ දී එ ජා පක්‍ෂයේ පිරිසක් සමග ආණ්ඩුවක් බිහිකිරීමට ඇය සූදානම් ය. ඇතැම්විට එවැනි ආණ්ඩුවක් බටහිරයන්ගේ ද ආධාර ඇතිව ජ වි පෙ මර්දනය කිරීමට ද එළඹෙනු ඇත.

ආණ්ඩුවේ ජ වි පෙ, ම එ පෙ හා ශ්‍රී ල නි ප ජාති හිතෛෂී මන්ත්‍රීවරුන්ට ඊනියා සාමකතාවලට විරුද්ධවිය නොහැකි නම් අඩුම තරමින් කොන්දේසි ඉදිරිපත් කළ හැකි ය. නෝර්වේ ඉවත්කිරීම, සාම සාකච්ඡා සඳහා පූර්ව අවශ්‍යතාවක් ලෙස කොටි සංවිධානය නිරායුධ කිරීම, කොටි සංවිධානය දෙමළ ජනයාගේ එකම නියෝජිතයා ලෙස නො පිළිගැනීම, උතුරු හා නැගෙනහිර පළාත් එකම ඒකකයක් ලෙස නොව ප්‍රදේශ දෙකක් ලෙස පිළිගැනීම, (ජනගහණය, ඉතිහාසය , භූ සම්පත් ආදී වශයෙන් ඒ පළාත් වෙනස් වෙයි.) ආදී වශයෙන් ඊනියා සාමකතා සඳහා කොන්දේසි ඉදිරිපත් කළ යුතු ය. බටහිරයන් එහි දී ආර්ථික බලපෑම් යොදන්නේ නම් ඒ බව නොවළහා ජනතාවට හෙළිදරවු කළ යුතු ය. මේ අතර චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට දැනගැනීමට සැලැස්විය යුතු ප්‍රධානම කරුණ වනුයේ සන්ධානය යනු ඇයට බුදලයට ලැබුණු එකක් නොවන බව ය. එමෙන් ම සන්ධානය ජයග්‍රහණය කෙළේ ද ඇගේ සමත්කමකට හෝ ආකර්ෂණයකට හෝ නොව ඊනියා සාම ව්‍යාපාරය, දෙමළ ජාතිවාදය හා විජාතික බලවේග පරාජයකිරීමට සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ට වූ අවශ්‍යතාව නිසා බව ද ඇය පිළිගත යුතු ය. ඇය ඒ බව නො පිළිගන්නේ නම් කළ යුත්තේ එකම එක දෙයකි. ඒ ඇය ඇගේ සාම්ප්‍රදායික නිජ භූමියට පිටත්කර හැරීම ය.

© Prof. Nalin De Silva